# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022
2025 සැප්තැම්බර් / ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

## ප්‍රතිබිම්බ කලා

(අධ්‍යයන වර්ෂ 2009 සිට 2016 දක්වා)

**ප්‍රතිබිම්බ කලාවේ මූලධර්ම සහ එහි පරිණාමය / ප්‍රතිබිම්බ කලාව පිළිබඳ හැඳින්වීමක්**

**IMAT – E1015**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි**

---

01. සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් කලා වර්ගීකරණයක් ඉදිරිපත් කොට, ඒ අතරින් ප්‍රතිබිම්බ කලාව විශේෂ වන්නේ කුමන කරුණු හේතු කොටගෙන ද යන්න පැහැදිලි කරන්න.

02. කැමරාව යනු මිනිස් ඇස පදනම් කොට සකස් කරන ලද මෙවලමක් බවට, ඒවායේ හරස්කඩ රූප සටහන් සහිතව තහවුරු කොට, ඇසේ ඵලදායිතාව වර්ධනය කරලීමට කැමරාවෙන් යම් අනුබලයක් ලැබෙන්නේ දැයි පරීක්ෂා කරන්න.

03. ඒකකාච ප්‍රතිඡායා කැමරාවක (Single-Lens Reflex Camera) හා අංකිත ඒකකාච ප්‍රතිඡායා කැමරාවක (Digital Single - Lens Reflex Camera) හරස්කඩ රූපයක් ඇඳ ඒවායේ සමාන අසමානතා විස්තර කරන්න.

04. ඡායාරූප ශිල්පය බිහිවීමට තුඩු දුන් හේතු සාධක මොනවාදැයි විමර්ශනාත්මකව ඉදිරිපත් කරන්න.

05. ඡායාරූප ශිල්පයේ උන්නතිය උදෙසා ලුයිස් මැන්ඩේ ඩැගියුරේ (Louis-Jacques-Mandé Daguerre) සහ හෙන්රි ෆොක්ස් ටැල්බොට් (Henry Fox Talbot) ගෙන් ඉටුවූ මෙහෙවර සංසන්දනාත්මකව අගයන්න.

06. නිහඬ යුගයේ චිත්‍රපට ප්‍රගමනයට සුවිශේෂ මෙහෙවරක් කළ සිනමාකරුවන් දෙදෙනෙකු තෝරා ඔවුන්ගෙන් ඉටු වූ සේවාව අගයන්න.

07. අන්තර්ජාලය මත පදනම්ව බිහිවූ නව මාධ්‍ය රූපවාහිනී මාධ්‍යයට අභියෝගයක් වන්නේ දැයි විස්තර කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් මාතෘකා දෙකක් තෝරා කෙටි සටහන් ලියන්න.

   i. අනාවරණය
   ii. කාච විවරය
   iii. දෘෂ්ටියේ අඛණ්ඩතාවය
   iv. චාලි චැප්ලින්
   v. ඩී.ඩබ්ලියු. ග්‍රිෆිත්

***********************************